**හිමිකම් රක්ෂණ අරමුදල - 2017**

---------------------------------------

හිමිකම් රක්ෂණ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝගවල 41 (1) නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | |
| (i) | 9 නියෝගය | ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණය භාරව සිටින අධ්‍යක්ෂවරයාගේ හා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ උපදෙස් ලබා ගැනීමකින් තොරව 2011 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බිල්පත් 65 ක රු. 34,256,464 ක් ආයෝජනය කර තිබුණි. |
| (ii) | 15 (1) නියෝගය | මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම සෑම වර්ෂයකම ජනවාරි මාසයේ පැවැත්විය යුතු වුවද අරමුදල ආරම්භ කළ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (iii) | 39 නියෝගය | අරමුදලේ ගෙවීම්, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කර, සහතික කිරීමේ බලය අතිරේක හෝ නියෝජ්‍ය හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙකු වෙත පැවරිය යුතු වුවද, එලෙස බලය පැවරීමකින් තොරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ගෙවීම් අනුමත කර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ගෙවීම් සහතික කර තිබුණි. |

(iv) 42 (අ) හා (ආ) නියෝග

හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කර ගන්නා මුදල් පිළිබඳ වාර්තා අදාළ බැංකු තැන්පතු පත්‍රිකාද සමඟ සති 2 කට වරක් ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතු නමුත්, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 6 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව මාස 07 ක වාර්තා එවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,963,760 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,901,617 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,062,143 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.583,550 කින් හා ආයෝජන පොළී ආදායම රු.1,595,132 කින් ඉහළයාම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල සඳහන් පරිදි මෙම අරමුදලේ අරමුණ, ඉඩමක හිමිකම් සම්බන්ධතාවය පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචිය සම්බන්ධයෙන් සිදුවන හානි පූර්ණය සඳහා වන්දි ගෙවීම විය. ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් වී නොතිබූ අතර අරමුදල ආරම්භකර තිබූ 2010 මාර්තු 01 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොතිබුණු අතර 2010 වර්ෂයේදී රු.800,515 ක් වූ මුළු ආදායම සමාලෝචිත වර්ෂය වන විට රු.12,702,884 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

හිමිකම් ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුමට හිමිකම් කාර්යාල මගින් බැරකර තිබූ රු. 1,079,805 ක ආදායම එම කාර්යාලවල ආදායම් වාර්තා සමඟ සසඳා නොතිබුණි. තවද කාර්යාල 02 ක හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එම ගිණුමට බැර කළ ආදායම හා ඉදිරිපත් කර තිබූ වාර්තා සැසඳීමේදී රු. 122,000 ක වෙනසක් පැවතුණි. ඒ අනුව හිමිකම් ආදායමින් සියයට 40 ක් වශයෙන් හිමිකම් රක්ෂණ අරමුදලට මාරු කළ රු. 9,252,146 ක් වූ ආදායමෙහි නිවැදිතාවය අනාවරණය නොවුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය 2018 පෙබරවාරි 21 දින අනුමත කර තිබූ අතර එම අයවැය ලේඛනයේ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 69 ක සිට සියයට 415 ක් අතර විචලනයක් නිරීක්ෂණය වූයෙන් අරමුදලේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර කාර්යසාධන වාර්තා සකස් කර ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.